රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය - අංක 67

ඒකාබද්ධ සේවා මාලා අංක 5

අංකය: 1/81/21(3)
1973 අප්‍රේල් මස 19 වැනි දින,
කොළඹ-7, ටොරිංටන් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ,
ඒකාබද්ධ සේවා අංශයේදී ය.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතය.

**වයස අවුරුදු 45 ට එළැඹ සිටින ලඝු ලේඛක සේවයේ පහල ශ්‍රේණියේ ලඝු ලේඛකයින් සඳහා වූ 11 වැනි කාර්යක්‍ෂමතා කඩඉමෙන් උසස්කිරීම.**

අංක. 238 සහ 1955.5.16 දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය යටතේ රු.5,736(ඒකාබද්ධ) වැටුප් තලයට පෙරාතුව, 11 වැනි කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණය සමර්ථවීමට පහල ශ්‍රේණියේ ලඝු ලේඛකයින්ට නියම කර ඇති, අංක. 15,011 සහ 1972 මැයි මස 19 දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද ලඝු ලේඛක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 13:7 යන වගන්තිය කෙරෙහි අවධානය යොමුකරවනු ලැබේ. වයස අවුරුදු 50 ට එළැඹ සිටියාවූද, යටත් පිරිසෙයින් අවුරුදු 15 ක් එම ශ්‍රේණියේ සේවය කර ඇත්තාවූ ද, නිලධාරීන් මෙම කාර්යක්‍ෂමතා කඩඉමෙන් නිදහස් කරන ලදි. (එවකට තුබූ අනුරූප වැටුප් තලය රු. 2,940 ක් විය.)

යටත් පිරිසෙයින් අවුරුදු 15 ක සේවයක් ඔවුන්ට තිබේ නම් සහ ඔවුන්ගේ වැඩ සහ හැසිරීම අනුව මෙම අනුග්‍රහය සනාථ කැරේ නම්, නිදහස් කිරීමේ කාර්යය සඳහා වයස් සීමාව අවුරුදු 45 තට දැන් අඩුකර තිබේ.

ඔබේ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ නියුක්ත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියේ සියලුම නිලධාරීන්ගේ අවධානයට මෙම තීරණය යොමු කරවනු මැනවි.

මෙම තීරණය ප්‍රකාර කාර්යක්‍ෂමතා කඩඉමෙන් උසස්කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍ර, පහත සඳහන් කොන්දේසි සපුරාලන නිලධාරීන් විසින්, මා වෙත දැන් ඉදිරිපත් කළ හැක. -

(1) 1973 අප්‍රියෙල් 1 වැනි දිනට වයස අවුරුදු 45 ට එළැඹ සිටිය යුතුය.

(2) යටත් පිරිසෙයින් අවුරුදු 15 ක් පහළ ශ්‍රේණියේ සේවය කර තිබිය යුතුය.

(3) කාර්යක්‍ෂමතා කඩඉමට ආසන්නතම පහළ වැටුප් තලයේ විය යුතුය.

නිලධාරියාගේ වැඩ සහ හැසිරීම අනුව මෙම අනුග්‍රහය සනාථ කැරෙන්නේ ද යන වග දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ/හෝ ලේකම් වරුන් විසින්, ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමේදී රපෝර්තු කළ යුතුවේ.

අංක. 238 සහ 1955.5.16 දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය මෙයින් අවලංගු කැරේ.

ආර්.එච්.බී.සේනානායක
ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්‍ෂ.
රාජ්‍ය පරිපාලන අධ්‍යක්‍ෂ ජනරාල් වෙනුවට.